# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1804/16 - 2013 අප්‍රේල් මස 03 වැනි බදාදා - 2013.04.03

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සුරාබදු ආඥාපනත**

අංක 957 දරන සුරාබදු නිවේදනය

**(ඊතයිල් මධ්‍යසාර) ස්ප්‍රීතු දේශීයව සැපයීම/ආනයනය මත සුරාබදු**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරිය වන) සුරාබදු ආඥාපනතේ 22 වැනි වගන්තියෙහි (1) වැනි උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, පහත සඳහන් නියමය ප්‍රකාශයට පත් කරමි.

2012 ඔක්තෝබර් 05 වැනි දිනැති අංක 1778/42 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 956 දරන සුරාබදු නිවේදනය සහ 1984 නොවැම්බර් 19 දිනැති අංක 324/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 736 දරන සුරාබදු නිවේදනය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2013 අප්‍රේල් මස 03 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

*නියමය*

(1) මෙහි උපලේඛනයේ I වැනි තීරුවේ වන අයිතමයන් මත ඊට අනුරූපව උපලේඛනයේ II වන තීරුවේ නිශ්චිත වශයෙන් දක්වා ඇති ප්‍රමාණයන් මත, උපලේඛනයේ III වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති පරිදි සුරා බද්දක් 2013.04.04 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නියම කොට අය කර ගත යුතු බව.

(2) වෙනත් කිසිම නිවේදනයක මීට පටහැනිව කිසිවක් සඳහන් වී තිබුණද, ඒ බව නොසලකා මෙම බදු ස්ප්‍රීතු ආනයනය කරන ලද වේලාවේ දී හෝ ස්කාගාරයෙන් තොග ගබඩාවෙන්, දේශීය නිෂ්පාදනාගාරයෙන් මුදා හරින වේලාවේදී හෝ ගෙවිය යුතු බව.


1A - G 017522 — 1135 (2013/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය*

| *I වැනි තීරුව*<br>*අයිතමය* | *II වැනි තීරුව*<br>*මසකට දේශීයව සපයනු ලබන/ආනයනය කරනු ලබන ලීටර් ප්‍රමාණය* | *III තීරුව*<br>*බදු ප්‍රමාණය (තොග ලීටරයට රුපියල්)* | |
|---|---|---|---|
| | | *දේශීය සැපයුම* | *ආනයනය* |
| 1 රජය විසින් අනුමත කරන ලද පර්යේෂණ හා අධ්‍යාපනික ආයතන, රෝහල් සහ රජයේ දෙපාර්තමේන්තු මගින් යොදා ගනු ලබන (ඊතයිල් මධ්‍යසාර) ස්ප්‍රීතු | (i) ලීටර් 100 දක්වා<br>(ii) ලීටර් 500 දක්වා<br>(iii) ලීටර් 10,000 දක්වා<br>(iv) ලීටර් 20,000 දක්වා<br>(v) ලීටර් 20,000ට වැඩි | නිදහස්<br>නිදහස්<br>රු. 350/=<br>රු. 450/=<br>රු. 700/= | නිදහස්<br>රු. 50 /=<br>රු. 400/=<br>රු. 500/=<br>රු. 800/= |
| 2 අවසන් නිපැයුම සුරාබද්ද ගෙවීමට යටත් නොවන, ඖෂධ හා කාර්මික නිෂ්පාදන සඳහා යොදා ගනු ලබන (ඊතයිල් මධ්‍යසාර) ස්ප්‍රීතු<br>(නැවත ප්‍රතිශෝධන සඳහා යොදා ගනු ලබන ස්ප්‍රීතු සඳහා ද මෙම කොන්දේසි අදාළ වේ.) | (i) ලීටර් 500 දක්වා<br>(ii) ලීටර් 10,000 දක්වා<br>(iii) ලීටර් 20,000 දක්වා<br>(v) ලීටර් 20,000ට වැඩි | නිදහස්<br>රු. 350/=<br>රු. 450/=<br>රු. 700/= | රු. 75/=<br>රු. 400/=<br>රු. 500/=<br>රු. 800/= |
| 3 මත්පැන් නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන (ඊතයිල් මධ්‍යසාර) ස්ප්‍රීතු | සෑම ලීටරයකටම | රු. 100*/= | රු. 200*/= |
| 4 අශුද්ධ ඊතයිල් මධ්‍යසාර ස්ප්‍රීතු (කාර්මික ස්ප්‍රීතු/දුර්වල ස්ප්‍රීතු සඳහා) | සෑම ලීටරයකටම | රු. 150/= | රු. 800/= |

* (ඊතයිල් මධ්‍යසාර) ස්ප්‍රීතු දේශීයව මිලදී ගැනීමේදී/ආනයනයේදී අයකරනු ලබන මෙම බද්ද, එම (ඊතයිල් මධ්‍යසාර) ස්ප්‍රීතු යොදා ගනිමින් නිෂ්පාදනය කළ මත්පැන් සඳහා අදාළ සුරාබදු ගෙවීමේදී හිලව් කිරීමට ඉඩ දෙනු ලබන රඳවා ගැනීමේ බද්දක් ලෙස අයකරනු ලැබේ.

04 - 637

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.